කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2022

2024 - අප්‍රේල්

BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04)

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 යටතේ "තොග" යන යෙදුම සුදුසු උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යටතේ "දේපල පිරියත හා උපකරණ" යන යෙදුම සුදුසු උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යටතේ අනාවරණය කිරීම් පහක් නම් කරන්න.

(ලකුණු 05)

ඉ. "කළමනාකරණ ගිණුම්කරණය" සහ "මූල්‍ය ගිණුම්කරණය" අතර වෙනස්කම් පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක - 02**

අ. "යැපෙන ශාඛාවක්" සහ "ස්වාධීන ශාඛාවක්" අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. පහත ගනුදෙනු ප්‍රධාන කාර්යාලයේ ගිණුම් පොත් වල සහ ශාඛාවේ ගිණුම් පොත් වල වෙන වෙනම සටහන් කරන්න.

i. ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට යවන ලද භාණ්ඩ තොගය - රු.725,000.

ii. ඉහත භාණ්ඩ තොගයෙන් රු.50,000 ක් වටිනා භාණ්ඩ නැවත ප්‍රධාන කාර්යාලය වෙත හරවා යවන ලදී.

iii. ශාඛාව විසින් දරන ලද ශාඛා වියදම් - රු.15,000.

iv. ප්‍රධාන කාර්යාලය විසින් දරන ලද ශාඛාවේ විදුලි වියදම රු.35,000.

v. ශාඛාව විසින් රු.50,000 ක් වටිනා භාණ්ඩ තොගයක්, තුන්වන පාර්ශවයකින්, ණය පදනම මත මිලදී ගන්නා ලදී.

vi. ශාඛා විකුණුම් වටිනාකම (ණය පදනම මත) - රු.1,500,000.

vii. ශාඛාවට අදාල ණයගැතියන්, ප්‍රධාන කාර්යාලය වෙත කල ගෙවීම් රු.30,000 කි.

viii. ප්‍රධාන කාර්යාලය විසින්, රු.11,000 ක් වටිනා ශාඛා ගැනුම් දරන ලදී.

ix. ශාඛාව මිලදී ගත් පරිගණකය රු.220,000 කි.

x. ශාඛාව විසින්, රු.16,000 ක් වටිනා ගෘහ භාණ්ඩ කට්ටලයක් ඔවුන්ගේ භාවිතය සඳහා මිලදී ගන්නා ලදී. නමුත්, එම ගෘහ භාණ්ඩ කට්ටලයට අදාල ගිණුම ප්‍රධාන කාර්යාලයේ පොත්වල පවත්වාගෙන යන ලදී .

(ලකුණු 20)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 03

අ. පහත දැක්වෙන යෙදුම් කෙටියෙන් පැහැදිලිකරන්න.

i. හවුල්කාරිත්වය

ii. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01)

iii. ණය ගැනීමේ පිරිවැය (LKAS 23)

iv. ප්‍රාග්ධනය

v. වත්කම් සහ වගකීම් (ලකුණු 02x5 = 10)

ආ. 2024 වර්ෂයේ මාර්තු 31 දිනට පූර්ණ සහ සහන් හවුල්ව්‍යාපාරයේ මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| ප්‍රාග්ධනය/ වගකීම් | වටිනාකම (රු.) | වත්කම් | වටිනාකම (රු.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ශේෂ | | ගොඩනැගිලි | 1,100,000 |
| පූර්ණ මහතා | 575,000 | කීතර්නාමය | 350,000 |
| සහන් මහතා | 450,000 | ආයෝජන | 115,000 |
| ආයෝජන උච්චාවචන අරමුදල | 300,000 | ණයගැතියෝ – අඩමාණ ණය වෙන්කිරීම (125,000 - 25,000) | 100,000 |
| පූර්ණ මහතාගේ ණය | 65,000 | භාණ්ඩ තොග | 110,000 |
| සහන් මහතාගේ ණය | 40,000 | බැංකු මුදල් | 105,000 |
| ණයහිමියෝ | 450,000 | | |
| එකතුව | 1,880,000 | එකතුව | 1,880,000 |

2024 වර්ෂයේ මාර්තු 31 වන දින හවුල්කරුවන් විසින් හවුල්ව්‍යාපාරය විසුරුවාහැරීමට තීරණය කරන ලද අතර එදින එකඟ වූ කොන්දේසි පහත පරිදි විය.

i. හවුල්ව්‍යාපාරය විසින් රු.43,000 ක් වටිනා භාණ්ඩ තොගයක් පවරා, පූර්ණ මහතා ගේ ණය මුදල පියවන ලදී.

ii. සහන් මහතා විසින් හවුල්ව්‍යාපාරයේ ආයෝජන වලින් 1/5 ක්, එහි වටිනාකමෙන් 10%ක් අඩුවෙන් පවරා ගන්නා ලදී.

iii. ණයගැතියෝ රු.130,000 කට උපලබ්ධි විය.

iv. රු.10,000ක් අඩුවෙන් ණයහිමියෝ පියවන ලදී.

v. ගොඩනැගිලි රු.1,210,000 කට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු.340,000 කට නැවත තක්සේරු කර ඇත.

vii. හවුල්ව්‍යාපාරයේ ඉතිරි ආයෝජන රු.110,000 කට පියවන ලදී.

viii. හවුල්ව්‍යාපාරයේ පොත්වල වාර්තා නොවූ පරිගණකයක්, පූර්ණ මහතා විසින් රු.86,000 කට පවරාගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු.21,000 කි.

පහත ගිණුම් පිළියෙල කරන්න.

a) උපලබ්ධි ගිණුම. (ලකුණු 05)

b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 05)

c) බැංකු ගිණුම. (ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක - 04**

අ. හවුල් ව්‍යාපාර ඒකාබද්ධ කල හැකි ප්‍රධාන ආකාර 03 නම් කරන්න. (ලකුණු 06)

ආ. මහේල - නුවන් හවුල් ව්‍යාපාරය සහ ඔල්ගා - පවන් හවුල් ව්‍යාපාරය යන හවුල් ව්‍යාපාර යුගලය, 2024 වර්ෂයේ අප්‍රේල් 01 වන දින 'ඔමේගා වෙළඳ සමාගම' යන නමින් ඒකාබද්ධ කිරීමට එකඟ විය. එම දිනට, පැවති හවුල්ව්‍යාපාර දෙකෙහි ශේෂ පත්‍ර පහත පරිදි විය.

| ප්‍රාග්ධනය/ වගකීම් | මහේල සහ නුවන් හවුල් ව්‍යාපාරය (රු. 000) | ඔල්ගා සහ පවන් හවුල් ව්‍යාපාරය (රු. 000) | වත්කම් | මහේල සහ නුවන් හවුල් ව්‍යාපාරය (රු. 000) | ඔල්ගා සහ පවන් හවුල් ව්‍යාපාරය (රු. 000) |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | ගොඩනැගිලි | 75,000 | - |
| මහේල | 55,000 | - | කීර්තිනාමය | - | 78,000 |
| නුවන් | 35,000 | - | ආයෝජන | 35,000 | - |
| ඔල්ගා | - | 28,000 | ණයගැතියෝ | 16,000 | 14,000 |
| පවන් | - | 26,000 | භාණ්ඩ තොග | 4,000 | 3,000 |
| පොදු සංචිත | 25,000 | - | | | |
| ණයහිමියෝ | 15,000 | 31,000 | | | |
| බැංකු ණය | - | 10,000 | | | |
| | | | | | |
| එකතුව | 130,000 | 95,000 | එකතුව | 130,000 | 95,000 |

මහේල සහ නුවන් 2:3 අනුපාතයට ලාභා/අලාභ බෙදාගත් අතර, ඔල්ගා සහ පවන් සමානව ලාභා/අලාභ බෙදාගන්නා ලදී.

ඒකාබද්ධකිරීමේ කොන්දේසි පහත පරිදි විය:

I. නව සමාගම වන ඔමේගා වෙළඳ සමාගම විසින්, මහේල සහ නුවන් හවුල් ව්‍යාපාරයට අයිති ගොඩනැගිල්ල රු.80,000,000 කට පවරාගන්නා ලදී.

II. නමුත්, මහේල සහ නුවන් හවුල් ව්‍යාපාරයේ ආයෝජන, ඔමේගා වෙළඳ සමාගම විසින් පවරා නොගන්නා ලදී.

III. ඔල්ගා සහ පවන් හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය වටිනාකමක් නැතැයි එකඟ විය.

IV. ඉහත ගැලපීම් වලින් පසු, රු.50,000,000 බැගින් අමතර ප්‍රාග්ධනය නව ව්‍යාපාරයට යෙදවීමට ඔල්ගා සහ පවන් එකඟ විය.

අවශ්‍ය වන්නේ;

a) මහේල සහ නුවන් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2024 අප්‍රේල් 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම. (ලකුණු 07)

b) ඔල්ගා සහ පවන් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2024 අප්‍රේල් 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම. (ලකුණු 07)

c) 2024 අප්‍රේල් 01 දිනට ඔමේගා වෙළඳ සමාගමෙහි ශේෂ පත්‍රය පිළියෙළ කිරීම. (ලකුණු 05)

**(මුළු ලකුණු 25)**